# ඍතුසංහාර කාව්‍යය පිළිබඳ විමසීමක්

කණුමුල්දෙණියේ චන්දසෝම හිමි

සංස්කෘත සාහිත්‍යය ඉතා පෘථුල හා ව්‍යාප්ත වූවකි. ඊට ප්‍රධාන හේතුවක් වන්නේ තත් සාහිත්‍යය වෛදික හා ලෞකික වශයෙන් යුග දෙකකට බෙදීයාමයි. ඍග්වේදයෙන් ආරම්භ වූ සාහිත්‍යය 'වෛදික' නාමයෙන් හැඳින්වෙන අතර එම යුගය උපනිෂද් කාලයෙන් අවසන් වේ. ඒ යුගය ග්‍රන්ථ වර්ග වශයෙන් සතරකින් යුක්ත වේ. එනම් සංහිතා ග්‍රන්ථ, බ්‍රාහ්මණ ග්‍රන්ථ, ආරණ්‍යක ග්‍රන්ථ හා උපනිෂද් ග්‍රන්ථ වශයෙනි. සාමාන්‍යයෙන් මේ අවධිය ක්‍රි. පූ. 1500- ක්‍රි.පූ. 500 වැනි කාලයට අයත් වේ. එසේම එම වෛදික සාහිත්‍ය යුගය භාරතයේ ඉපැරණි ආගමික සාහිත්‍ය ලියන ලද යුගය ලෙස ද හැඳින්වේ. එනම් එම කාලයේදී ප්‍රධාන වශයෙන් දේව වන්දනය හා දේව භක්තිය ප්‍රකාශනය සඳහා කැප වූ සාහිත්‍යයක් පැවැතීමයි. ඉන් අදහස් වන්නේ වෙනත් සාහිත්‍යංගයන් නොපැවැතීම බව නොවේ. එනම් ශ්‍රව්‍ය කාව්‍ය හා දෘශ්‍ය කාව්‍යයන්හි මූල බීජයන් ද වෛදික සාහිත්‍යයේ අන්තර්ගත වූ බැවිනි. එම මූල බීජයන් පදනම් කොට පසු කාලයේ මහා වෘක්ෂයන් ලෙස වර්ධනය වී සංස්කෘත සාහිත්‍යය ලෝකයේ සුවිශේෂ සාහිත්‍යයක් බවට පත් විය. ලෞකික සංස්කෘත යුගය හෙවත් සම්භාව්‍ය සංස්කෘත යුගය වශයෙන් එය හැඳින්වේ. එම යුගයේ ආරම්භය මහර්ෂි පාණිනී වෛයාකරණා චාය්ඊවරයාණගේ (ක්‍රි.ව.05) 'අෂ්ටධ්‍යායී' ව්‍යාකරණ රචනයෙන් පසු ආරම්භ වීයැයි සලකුණු කෙරේ. මෙම සම්භාව්‍ය සාහිත්‍ය යුගයේදී අංශ රාශියක් සංවර්ධනය වන්නට විය. ඒවා මෙසේ වර්ග කළ හැක.

**ශ්‍රව්‍ය** - මෙය කොටස් දෙකකි. එනම් ගද්‍ය හා පද්‍යයි.
**දෘශ්‍ය** - මෙහි කොටස් දෙකකි. එනම් රූපක හා උපරූපකයි.
**ගද්‍ය** - මෙය කොටස් තුනකි. කථා, ආඛ්‍යාන හා ආඛ්‍යායිකායි.

**පද්‍ය** - මෙහි අංශ තුනකි. මහාකාව්‍ය, ඛණ්ඩ කාව්‍ය හා කෝෂ කාව්‍යයි.

**චම්පු** - ගද්‍ය පද්‍ය මිශ්‍ර කාව්‍යයි.

ඉහත වර්ග කිරීම් අනුව කෙටියෙන් නම් කළ හැක්කේ මේ යුගය 'සංස්කෘත කාව්‍ය යුගයක්' ලෙසයි. විශේෂයෙන් මෙහිදී අපගේ අවධානය යොමු වන්නේ සංස්කෘත කාව්‍ය සාහිත්‍යයේ ඉතා දීප්තිමත් කාව්‍ය කතෘ වූ කාලිදායන් විසින් රචිත ඍතුසංහාරම් (ඍතුන් කැඳවීම) කාව්‍ය පිළිබඳ විමසා බැලීමටයි.

කාලිදාස නම් සංස්කෘත සාහිත්‍යයේ මහා කාව්‍යකරු සුප්‍රකට සංස්කෘත ග්‍රන්ථ කීපයක්ම රචනා කොට ඇත. ඒවායේ වර්ග කිරීම අනුව මෙසේය.

මහාකව්‍ය දෙකකි. එනම් රඝුවංශම් හා කුමාරසම්භවම්. නාට්‍ය තුනකි. එනම් මාලවිකාග්නිමිත්‍රම්, වික්‍රමෝර්වශීයම් හා අභිඥාන ශාකුන්තලම්. ඛණ්ඩ කාව්‍ය දෙකකි. එනම් මේඝදූතම් හා ඍතුසංහාරම් යනුවෙනි.

ඍතුසංහාරම් හා මේඝදූතම් යනු භාවගීත කාව්‍යයෝය. භාවගීත යනු කවියාගේ චිත්තාභ්‍යන්තරයේ හටගන්නා චමත්කාර සිතිවිලි පරම්පරාවයි. එම සිතිවිලි මාලාව ශෘංගාර, හාස්‍ය, කරුණ ස්ථායීභාවයන් මුල් කොට චමත්කාර සිතිවිලි උත්පාදනය වේ. එවැනි කාව්‍ය කෘති නිර්මාණය කළ කතෘන්ගෙන් සංස්කෘත භාවගීත කාව්‍ය සාහිත්‍යය පොහොසත් වේ. භර්තෘහරිගේ ශෘංගාර ශතකම්, නීතිශතකම් හා වෛරාග්‍ය ශතකම් ද, අමරුකගේ අමරු ශතකම් ද, ජයදේවයන්ගේ ගීතගෝවින්දම් ආදී ග්‍රන්ථයෝ තත් සාහිත්‍යයික ක්ෂේත්‍රයේ ප්‍රකට නිදර්ශනයෝ වෙති. ඍතුසංහාරය කාව්‍යය විමසා බැලීමෙන් මේ කාරණය තවදුරටත් මැනවින් පැහැදිලි වේ.

ස්වභාව සෞන්දර්යයෙන් කුල්මත් වූ කාලිදාස විසින් විටින් විට තම සිතැඟි පරිදි පද්‍යයන් රචනා කොට පසු අවස්ථාවක කාව්‍ය කෘතියක් බවට 'ඍතුසංහාරය' පත් කරන්නට ඇතැයි ද සිතිය හැක. මේ නිසා තත් කාව්‍යයේ එකම සර්ගයේ නොගැලපෙන පුනරුක්ත ලක්ෂණයන් බහුලව දැකිය හැක. එසේ ම එකල 'හිටිවනම' පද්‍ය ගායනා කිරීමේ හා ඒ සඳහා කවීන්ගේ තරග කිරීමේ සංස්කෘතියක් ද



භාරතයේ පැවැති බව ප්‍රකට කරුණකි. 16 වැනි සියවසේ කෘතියක් වුවද 'භෝජ ප්‍රබන්ධය' කවියන් අතර තිබූ එකී ලක්ෂණ මතු කොට දක්වා ඇත. මේනිසා එවැනි හිටිවන පද්‍ය ගායනා කිරීමේ සංස්කෘතියක ප්‍රතිඵලයක් ලෙස ඍතුසංහාර කාව්‍යය බිහිවිණැයි ඇතැම්හු කල්පනා කරති. විවිධ අවස්ථාවන් හා විවිධ ඍතූන් සම්බන්ධයෙන් ගායනා කළ පද්‍යයන් මේ සඳහා උපකාරී වන්නට ඇත. පසු අවස්ථාවක ඒ සියලු පද්‍යයන් එකතු කොට 'ග්‍රන්ථයක්' බවට පත් කළේයැයි උපකල්පනය කිරීම සාවද්‍ය නොවේ.

එසේම මෙහිදී පෙනෙන අනෙක් කාරණය නම් මේ කෘතිය රචනා කරන සමයේ කවියා විසින් කිසිදු රාජ්‍ය අනුග්‍රහයක් නොලද බවයි. එනම් කාලිදාස එවක සාමාන්‍ය පුද්ගලයෙකු විය හැක. ඍතු විපර්යාසයන් නිසා රාජ මන්දිරයේ හෝ රාජ ජීවිතයේ සිදු වන වෙනස්කම් කාව්‍යයේ අවධාරණය කොට නැත. එහෙත් කලා කාමීන්ට මහත් පිටුබලයක් ලැබෙන ආර්ථික හා දේශපාලනික පරිසරයක් තිබූ බව ද ග්‍රන්ථයෙන් පැහැදිලි වේ. ග්‍රාමීය ජන ජීවිතය හා ශිෂ්ට සම්පන්නයැයි සැලකෙන නාගරික ජීවිතය ද මෙහි නිරූපිත වේ. ඇතැම් විට මේ සමය වන විට විදේශික වෙළෙඳ සම්බන්ධතා නිසා සුවඳ විලවුන් වර්ග, රත්රන් හා මැණික් හා වෙනත් සුඛෝපභෝගී ද්‍රව්‍ය සුලභ වන්නට ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස නාගරික ජීවිතයේ සුඛනම්‍යතාවක් සිදු වූ බව ග්‍රන්ථ පරිශීලනයෙන් පැහැදිලි වේ.

ඍතුසංහාර කාව්‍යය සර්ග සයකට බෙද ඇත. එහි එක සර්ගයක පද්‍යයන් 16 සිට 28 දක්වා අන්තර්ගත වේ. ඊට අමතරව ප්‍රක්ෂිප්ත ශ්ලෝක නම් අතුරු ශ්ලෝක රාශියක් ද ඇතැම් සංස්කරණයන්හි දක්නට හැක. අප විසින් පරිවර්තනය කළ ග්‍රන්ථයේ එවැනි ශ්ලෝක 14 ක් බහා ඇත. ඒ අනුව ග්‍රන්ථයේ සර්ග හා අන්තර්ගත ශ්ලෝක ප්‍රමාණය මෙසේය.

- පළමු සර්ගය- ග්‍රීෂ්ම වර්ණනා ශ්ලෝක 28
- දෙවැනි සර්ගය- වර්ෂා වර්ණනා ශ්ලෝක 28
- තෙවැනි සර්ගය- ශරත් වර්ණනා ශ්ලෝක 26
- සිව්වැනි සර්ගය- හේමන්ත වර්ණනා ශ්ලෝක 18
- පස්වැනි සර්ගය- සිසිර වර්ණනා ශ්ලෝක 16
- සවැනි සර්ගය- වසන්ත වර්ණනා ශ්ලෝක 28
- අතුරු ශ්ලෝක- ප්‍රක්ෂිප්ත ශ්ලෝක 14

02 OCT 2015

භාරතීය ඍතුන් සාමාන්‍යයෙන් මෙසේ බෙද දක්විය හැක. එනම් ග්‍රීෂ්ම ඍතුව ජුනි හා ජුලි මාසවල ද, වර්ෂා සමය අගෝස්තු හා සැප්තැම්බර් මාසවල ද, සරත් කාලය ඔක්තෝබර් හා නොවැම්බර් කාලය ද, හේමන්ත ඍතුව දෙසැම්බර් හා ජනවාරි මාසවල ද, ශිශිර ඍතුව පෙබරවාරි හා මාර්තු මාසවල ද, වසන්ත ඍතුව අප්‍රේල් හා මැයි මාසවල ද වශයෙනි. වෘක්ෂ ලතාවන්ගේ වෙනස්කම්, වන සතුන්ට හා පක්ෂීන්ට සිදු වන බලපෑම, තරුණ කාම කාමිනීන්ගේ පමණක් නොව දම්පතීන්ගේ ද අපූරු වෙනස්කම් ද ඉස්මතු කොට දක්වීමට කවියා යම් ප්‍රමාණයකින් සමත් වී ඇත. ඍතුසංහාර කාව්‍යයේ සෑම සර්ගයකම ආරම්භක හා අවසාන ශ්ලෝක ද්වය නිදර්ශන ලෙස ගෙන බැලීමෙන් කාව්‍යයේ ස්වභාවය පිළිබඳ අවබෝධයක් ලැබිය හැක.

ග්‍රීෂ්ම ඍතුවේ ආරම්භයඃ

ප්‍රචණ්ඩසූර්‍යඃ ස්පෘහනීය චන්ද්‍රමාඃ සදාවගාහක්ෂතවරිසඤ්චයඃ
දිනාන්ත රම්‍යෝ'භ්‍යුපශාන්තමන්මථෝ නිදාඝකාලෝ'යමුපාගතඃ ප්‍රියේ.
(1.1)

'ප්‍රේමිය, ප්‍රචණ්ඩ වූ සූර්‍යයා හා දර්ශනීය චන්ද්‍රයා ඇති, නිතරම ස්නානය කළ නිසා සිඳී ගිය ජලාශ ඇති, සන්ධ්‍යා කාලයෙන් රම්‍ය වූ අතිශයින් සමනය වූ කාමය ඇති මේ ග්‍රීෂ්ම සමය එළඹ ඇත'.

ග්‍රීෂ්ම ඍතුවේ අවසානයඃ

කමලවනචිතාම්බුඃ පාටලාමෝදරම්‍යඃ
සුඛසලිලනිෂේකඃ සේව්‍යචන්ද්‍රාංශුහාරඃ
ව්‍රජතු තව නිදාඝඃ කාමිනීභිඃ සමේතෝ නිශි
සුලලිතගීතේ හර්ම්‍ය පෘෂ්ඨේ සුඛේන.
(1.28)

'නෙළුම් විල්වල ජලය රැස්වූයේ, පලොල් සුවඳින් සුවඳවත් වූ සුවදායී ජලය ස්නානය කරන්නා වූ, සේවනය කළ යුතු සඳ කිරණ නමැති මුතුවැල් ඇති, සුන්දර ගීත ගයන රාත්‍රී කාලයේ සඳළු තලය මත කාමිනීන් සමග සිටින ඔබට නියං සමය සුවදායක ලෙස ගමන් කෙරේවා'.



වර්ෂාඍතුවේ ආරම්භයඃ

සශීකරාම්භෝදරමත්තකුඤ්ජරස් තඩිත්පතාකෝ'ශනිශබ්දමර්දලඃ
සමාගතෝ රාජවදුද්ධතද්‍යුතිර් ඝනාගමඃ කාමිජනප්‍රියඃ ප්‍රියේ.
(2.1)

'ප්‍රේමිය, කාමී ජනයාට ප්‍රිය වූ තියුණු කාන්ති ඇති වර්ෂා කාලය රජෙකු ලෙස පැමිණ ඇත. ජල බිංදු සහිත මේඝය මද වැඩී ගිය ඇතෙකි. විදුලිය පතාකා වේ. හෙණ වනාහි මර්දල නම් බෙර හඬයි'.

වර්ෂාඍතුවේ ආවසානයඃ

බහුගුණරමණීයඃ කාමිනීචිත්තහාරී
තරුවිටපලතානාං බාන්ධවෝ නිර්විකාරඃ
ජලදසමය ඒෂ ප්‍රාණිනාං ප්‍රාණභූතෝ
දිශතු තව හිතානි ප්‍රායශෝ වාඤ්ඡිතානි.
(2.28)

'නොයෙක් විශිෂ්ට ගුණයන්ගෙන් රමණීය වූද, සරාගී කාන්තාවන්ගේ සිත් පැහැර ගන්නා වූද, වෘක්ෂ ශාඛා හා ලතාවන්ගේ මිතුරු වූද, ලැව් ගිනි ආදී විකාර ස්වරූප නැත්තා වූද, සියලු සත්වයන්ට ජීවය හා සමාන වූද මේ වර්ෂා සමය ඔබට කැමැති හා යහපත් දේ ප්‍රදානය කෙරේවා'.

සරත් ඍතුවේ ආරම්භයඃ

කාශාංශුකා විකචපද්ම මනෝඥවක්ත්‍රා
සෝන්මාද හංසරව නූපුරනාදරම්‍යා
ආපක්වශාලි රුචිරාතනුගාත්‍රයෂ්ටිඃ
ප්‍රාප්තා ශරන්නවවධූරිව රූපරම්‍යා. (3.1)

'වැලුක් මල් පිපී සුදු වස්ත්‍රයක් මෙන් වූද, පියුම් පිපීමෙන් සුන්දර මුහුණක අසිරිය ගත්තා වූද, කාමාශක්ත හංසයන්ගේ නාදයට සමාන වූ පා සළඹෙහි නාදයෙන් රම්‍ය වූද, හොඳින් පැසුණු සුවඳැල් ධාන්‍ය

'මෙන් සුන්දර අවයවයන්ගෙන් යුක්ත වූද, රූපයෙන් මනහර වූද නව යොවුන් කාන්තාවක මෙන් සරත් කාලය පැමිණ ඇත'.

සරත් ඍතුවේ අවසානය:

විකච කමලවක්ත්‍රා ඵුල්ල නීලෝත්පලාක්ෂී
විකසිත නව කාශශ්වේතවාසෝ වසානා
කුමුද රුචිර කාන්තිඃ කාමිනීවෝන්මදේයං
ප්‍රතිදිශතු ශරද්වශ්චේතසඃ ප්‍රීතිමග්‍ර්‍යාම්.

(3.26)

'විකසිත පියුමක් වැනි මුහුණක් ඇති, පිපුණු මහනෙල් මලක් වැනි ඇස් ඇති, විකසිත නව වැලුක් මල් වැනි සුදු වස්ත්‍ර දරන්නී වූ, හෙළුපුල් වැනි මනහර කාන්ති ඇති කාමාශක්ත යුවතියක මෙන් මේ සරත් සමය ඔබලාගේ සිතට ශ්‍රේෂ්ඨ ප්‍රීතියක් ලබාදේවා'.

හේමන්ත ඍතුවේ ආරම්භය:

නව ප්‍රවාලෝද්ගමසස්‍යරම්‍යඃ ප්‍රඵුල්ලලෝධ්‍රඃ පරිපක්වශාලිඃ
විලීනපද්මඃ ප්‍රපතත්තුෂාරෝ හේමන්ත කාලෝ සමුපාගතෝ'යම්.

(4.1)

'ලාදලු හටගැනෙන, ධාන්‍ය අස්වැන්නෙන් රම්‍ය වූ, සුපිපුණු ලෝධ්‍ර මල් ඇති, යහමින් පැසුණු සුවඳැල් ඇති, සැඟවුණු පියුම් ඇති, වැටෙන හිම ඇති මේ හේමන්ත සමය උදා වී ඇත'.

හේමන්ත ඍතුවේ අවසානය:

බහුගුණ රමණීයෝ යෝෂිතාං චිත්තහාරී
පරිණත බහුශාලි ව්‍යාකුල ග්‍රාමසීමා
විනිපතිත තුෂාරඃ ක්‍රෞඤ්ච නාදෝපගීතඃ
ප්‍රදිශතු හිමයුක්තස්ත්වේෂ කාලඃ සුඛං වඃ.

(4.18)



'නොයෙක් ගුණයන්ගෙන් මනහර වූ, සුන්දරියන්ගේ සිත් ගන්නා වූ, පැසුණු බොහෝ සුවඳැල් ධාන්‍යවලින් පිරුණු කෙත් වතු ඇති, නිතරම වැටුණු හිම ඇති, ලිහිණි නාදයෙන් ගීතවත් වූ මේ හේමන්ත කාලය ඔබලාට සැප සදාවා'.

සිසිර ඍතුවේ ආරම්භය:

ප්‍රරූඪ ශාලීක්ෂුචයාවෘත ක්ෂිතිං ක්වචිත් ස්ථිත ක්‍රෞඤ්ච නිනාදරාජිතම්
ප්‍රකාමකාමං ප්‍රමදාජන ප්‍රියං වරෝරු කාලං ශිශිරාහ්වයං ශ්‍රුණු.

(5.1)

'සුන්දර වටොර ඇත්තිය, හොඳින් වැඩුණු සුවඳැල් ධාන්‍ය හා උක් සමූහයෙන් ආවරණය වූ පොළෝ තලය ඇති, කිසියම් තැනෙක සිටි ලිහිණියන්ගේ නාදයෙන් සුන්දර වූ අධික කාමය ඇති තරුණියන්ට ප්‍රිය වූ සිසිර නමැති කාලය ගැන අසන්න'.

සිසිර ඍතුවේ අවසානය:

ප්‍රචුර ගුඩවිකාරඃ ස්වාදු ශාලීක්ෂුරම්‍යඃ
ප්‍රබල සුරතකේලිර් ජාත කන්දර්ප දර්පඃ
ප්‍රියජන රහිතානාං චිත්තසංතාප හේතුඃ
ශිශිරසමය ඒෂඃ ශ්‍රේයසේ වෝ'ස්තු නිත්‍යම්.

(5.16)

'කැමවල උක් හකුරු බෙහෙවින් ඇත්තේ, පැසුණු සුවඳැල් හා උක්වලින් රම්‍ය වූ, අධික කාම සම්භෝගයෙන් හටගත් කාම දේවගේ අබිමන් ඇති, ප්‍රේමීන් නැත්තන්ට සංතාපයට හේතු වූ මේ සිසිර සමය ඔබලාට සැබවින්ම ඔබලාට යහපත පිණිස පවතීවා'.

වසන්ත ඍතුවේ ආරම්භය:

ප්‍රඵුල්ල චූතාඞ්කුර තීක්ෂ්ණ සායකෝ ද්විරේඵමාලා විලසද්ධනුර්ගුණඃ
මනාංසි භේත්තුං සුරතප්‍රසඞ්ගිනාං වසන්ත යෝද්ධාං සමුපාගතඃ ප්‍රියේ.

(6.1)

'ප්‍රේමිය, සුපිපි අඹ දලු නමැති තියුණු හී ඇති, මී මැසි වැල නමැති බබළන දුනු දිය ඇති, වසන්ත නම් වීරවරයා රති ක්‍රීඩාශක්ත කාමීන්ගේ සිත් දැදුරු කරන්නට පැමිණ ඇත'.

වසන්ත ඍතුවේ අවසානයඃ

ආම්‍රී මඤ්ජුලමඤ්ජරී වරශරඃ සත්කිංශුකං යද්ධනුර්
ජ්‍යා යස්‍යාලිකුලං කලඞ්කරහිතං ඡත්‍රං සිතාංශුඃ සිතම්
මත්තේභෝ මලයානිලඃ පරභෘතා යද්වන්දිනෝ ලෝකජිත්
සෝ'යං වෝ විතරීතරීතු විතනුර්භද්‍රං වසන්තාන්විතඃ.

(6.28)

'මනහර අඹ රේණු නම් යමෙකුගේ උතුම් හී සර වෙයිද, සුන්දර කැල මල් නම් යමෙකුගේ දුන්න වෙයිද, බඹර සමූහයා නම් යමෙකුගේ දුනු දිය වෙයිද, කැළැල් රහිත සුදු කුඩය නම් චන්ද්‍රයා වෙයිද, මලය පවන නම් මත් වූ ඇත්තු වෙත්ද, කොවුලෝ නම් යමෙකුගේ ගායකයෝ වෙත්ද, එකී මෙකී ලෝකය දිනන වසන්ත සහාය වූ අනංගයා හෙවත් කාමය ඔබලාට යහපතක් බෙහෙවින් ප්‍රදානය කෙරේවා'.

ඉහත සඳහන් පද්‍ය කිහිපය පමණක් කවියාගේ වර්ණනාත්මක දෘෂ්ටිය හා ශෛලිය වටහා ගැනීමට ප්‍රමාණවත් වේ. එක් පක්ෂයකින් ස්වභාව සෞන්දර්‍ය්‍ය අගයන අතර ම තවත් පක්ෂයෙකින් තාරුණ්‍යයේ චමත්කාරය ද හෙලි පෙහෙළි කරයි. කවියාට වසන්ත කාලය පමණක් නොව ග්‍රීෂ්ම සමය ද එකතු කරනුයේ ආශ්වාදයකි. මේ නිසා කවියාගේ නිර්මාණ ස්වභාවය හා එයින් කාලිදාසයන් පිළිබඳව ලබා ගත හැකි නිගමන ද සලකා බැලිය යුතුය.

අවස්ථා හා සංකල්ප නිර්මාණය කිරීමෙහිලා කාලිදාසයන් මනා ප්‍රතිභාවක් දක්වා ඇති බව ප්‍රකට කරුණකි. කාව්‍යයක් යනු මූළමනින් ම සංකල්ප නිර්මාණය කිරීමකි. කාව්‍යය යනු කුමක්දැයි වැලිවිටියේ පේමරතන ස්ථවිර හා හල්ගස්තොට දේවානන්ද ස්ථවිරයන් විසින් සම්පාදිත 'සුබෝධිනී ව්‍යාඛ්‍යා සහිත කාව්‍යාදර්ශයේදී මෙසේ දක්වා ඇත.



කවනීයං කාව්‍යම් ඉති ලෝචනකාරඃ.
කවයති කවිඃ, තස්‍ය කර්ම කාව්‍යම් ඉති විද්‍යාධරඃ.
කෞති ශබ්දායතේ විමෘශති රස භාවාන් ඉති කවිඃ, තස්‍ය (කවේඃ) කර්ම කාව්‍යම් ඉති භට්ටගෝපාලඃ

මෙසේ විවිධ ආලංකාරිකයන් විසින් දැක් වූ අදහස් කීපය පමණක් කාව්‍යය යනු කුමක්දැයි වටහා ගැනීමට ප්‍රමාණවත් වේ. කවියේ මුඛ්‍ය අරමුණ රස ජනනයයි. ඒ සඳහා කවියාට ප්‍රතිභාවක් තිබිය යුතුය. කාලිදාස ජීවත් වූ යුගයේ පවත්නා දුඃඛ දෝමනස්සයන් වටහා ගෙන කාව්‍යකරණය කළ උත්තම කවියෙකු වූ හෙයින් සර්ව කාලීන ඇගයීමක් ඔහුට ලැබුණි. සාහිත්‍යකරුවෙකුගේ ප්‍රතිභාව ජී. බී. සේනානායක (1965) 'විචාර ප්‍රවේශයේ' (පි.51) මෙසේ අර්ථකථනය කරයි.

"කවියා ජීවිතයේ සෞන්දර්යය ද ගුප්තාර්ථයන් ද දකින්නේ ප්‍රතිභාවෙනි. එය ජීවිතයේ විනිවිද බලන නුවණකි. සාහිත්‍යකාරයාගේ ප්‍රතිභාව ඔහුගේ කාලයෙහිත් ඊට පෙරත් පහළ වූ සිතුම් පැතුම් විශ්වාස ආදිය මුල් කොට ගෙන මුල් කොට ගෙන පහළ වූවකි. ........."

කවියාගේ ප්‍රතිභාව කාව්‍යකරණයට ඉවහල් වන ප්‍රධාන හේතුවකි. 'ප්‍රතිභාව' නම් කෙටි වදනකින් හැඳින්වුව ද කාව්‍යකරණය සඳහා ත්‍රිවිධ සම්පත් හේතු වන බව කාව්‍යාදර්ශය පෙන්වා දේ. එනම් නිසර්ගයෙන් කවියා තුළ පවත්නා ප්‍රතිභාවත්, බොහෝ ශාස්ත්‍ර පරිශීලනයෙන් ග්‍රහණය කරගත් ශාස්ත්‍ර ඥානයත් හා නිරන්තර අභ්‍යාසයත් යන කාරණාවෝ වෙති. දණ්ඩී කෘත කාව්‍යාදර්ශයේ (1.103) මෙසේ සඳහන් වේ.

නෛසර්ගිකී ච ප්‍රතිභා ශ්‍රැතං ච බහු නිර්මලම්
අමන්දශ්චාභියෝගෝ'ස්‍යාඃ කාරණං කාව්‍යසම්පදඃ. (කාව්‍යාදර්ශ 1.103)

මේ අනුව ප්‍රතිභානයේ ප්‍රතිඵල විසින් කවියාගේ සිතට 'අර්ථවස්තු' නම් සංකල්ප රූප ජනිත වේ.

'මහා කවීන්ගේ මුවින් ගලා යන්නා වූ අර්ථයෙන් පරිපූර්ණ වූ රසවත් වචනය ලෝකෝත්තර වූ අසාමාන්‍ය වූ බබලන්නා වූ ප්‍රතිභා විශේෂය පැහැදිලි කරයි' යන්න ආනන්දවර්ධන කෘත 'ධ්වන්‍යාලෝක' ග්‍රන්ථය විවරණය කරයි.

සරස්වතී ස්වාදු තදර්ථවස්තු නිඃස්‍යන්දමානා මහතාං කවීනාම්
අලෝකසාමාන්‍යමභිව්‍යනක්ති පරිස්ඵුරන්තං ප්‍රතිභාවිශේෂම් .
ධ්වන්‍යාලෝක 1.6

මේ ආකාරයේ කවියන් ලෝකයේ බහුල වශයෙන් සිටිය හැක. එසේ වුවත් මහා කවීන් සිටිනුයේ අතලොස්සකි. ඔවුහු යුග ගණනාවක් ජීවත් වෙති. ඒ සම්බන්ධ ප්‍රකාශයක් ජී. එස්. බී. සේනානායක 'ධ්වන්‍යාලෝක විවරණයේදී' (පි.36) රාජශේඛරගේ කාව්‍යමීමාංසාවෙහි පැණෙන බව උද්ධෘත කොට දැක්වේ.

මුක්තතෙ කවයො'නන්තාඃ සංඝාතෙ කවයඃ ශතම්
මහා ප්‍රබන්ධෙ තු කවිරෙකෝ ද්වෞ යදි වා ත්‍රයම්.

'මුක්තක නම් ඒක පද්‍ය සම්බන්ධ කාව්‍යයෙහි කවියෝ අනන්ත වෙති. සංඝාත නම් එකිනෙකින් වෙන් වූ ශ්ලෝක සමූහ රචනය කවියෝ සිය දෙනෙකි. මහා ප්‍රබන්ධ විෂයෙහි කවියෙකු ඇත්තේ එක් අයෙකි. නැත්නම් දෙදෙනෙකි. එසේත් නැත්නම් තිදෙනෙකි'. කාලිදාස අයත් වනුයේ එම ගණයට බව විද්වතුන්ගේ පිළිගැනීමයි.

ඉහත අදහස් සැලකිල්ලට ගත් විට සංකල්ප රූප හෙවත් අර්ථවත් ප්‍රකාශයක් අපූර්ව වස්තුවක් ලෙස කවියා ඉදිරිපත් කරයි. එය ම නව්‍යමය රසයක් සහෘදයාට ලබා දීමට සමත් වේ. ධ්වන්‍යාලෝක ලෝචනකාරිකාවේ (1.6.) 'අපූර්වවස්තුනිර්මාණක්ෂමා ප්‍රඥ' වශයෙන් අවධාරණය කරනුයේ එම කාරණයයි. අපූර්ව වස්තු නිර්මාණය සමග කරුණු රාශියක් සහෘදයාට විඳින්නට අවස්ථාව උදා වනු ඇත. එනම්

- නව්‍යතාව (Fressness & Novelty)
- අධික තීව්‍රතාව (Intensity)
- ප්‍රබෝධ ශක්තිය (Evocative Power)



- සාමීප්‍යතාව (Familiarity
- අනුරූපතාව (Congruity)
- භාවයන්හි සාරවත්භාවය (Fertility) වශයෙනි.

මෙ පිළිබඳව සංක්ෂේපයෙන් සඳහන් කරනු වටී. පෙර නොවූ විරූ අදහසක් කිසියම් කාව්‍යයක් විසින් හෙළි කෙරේ නම් එය නව්‍යතාවකි. පූර්වයෙහි ප්‍රකාශිත අදහසක් හෝ සංකල්පයක් නැවත නැවතත් ප්‍රකාශවීමෙන් සෞන්දර්යයක් හෙවත් චමත්කාරයක් හට නොගනු ඇත. එහෙත් කාව්‍යයේ යම් නව්‍යතාවක් වේ නම් සහෘද ආකාර්ෂණයක් එහි ජනිත වනු ඇත. සංස්කෘත සාහිත්‍යයෙහි මෙය 'නවෝන්මේෂශාලිනී' නමින් ප්‍රකාශ වී ඇත. මීට නිදර්ශනයක් ලෙස ඍතුසංහාර කාව්‍යයේ පද්‍යයක් දැක්විය හැක. නිශාක්ෂයේ යාති හ්‍රියේව පාණ්ඩුතාම්- (ඍතු 1.9) අධික තීව්‍රතාව යනු ඉතා විශාල දීර්ඝ ප්‍රකාශයක් කෙටි මාර්ගයකින් දක්විය හැකි බවයි. එය රචකයාගේ දක්ෂතාවකි. ඍතුංහාරයේ ස්ත්‍රියෝ නිදසං ශමයන්ති කාමිනාම්- (ඍතු 1.4.) පද්‍ය කණ්ඩය අගනා උදාහරණයකි. එසේම ප්‍රබෝධ ශක්තිය නම් කාව්‍ය පරිශීලනයෙන් සහෘදයා ලබා ගන්නා ප්‍රඥවට සමීප රසයයි. ඉන් ඔහුගේ ස්මරණ ශක්තිය ප්‍රබල වේ. ඇතැම් විචාරකයන් මෙය ඉතා උසස් ප්‍රඥවක් ලෙස දක්වා තිබුණත් ඍතුසංහාරය වැනි කාව්‍යයකින් එවැනි ගැඹුරු ප්‍රඥවක් අපේක්ෂා කළ නොහැක. එහෙත් ග්‍රන්ථයේ ඇතැම් ප්‍රකාශ තුළින් සමාජය හා ලෝකය පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් සහෘදයාට ලබා දේ. ඇතැම් ශ්ලෝක හුදු වර්ණනා නොව කාලීන භාරත සමාජය පිළිබඳ අවබෝධය තීව්‍ර කිරීමට ඉවහල් වනු ඇත. ජී. බී. සේනානායක 'විචාර ප්‍රවේශයේදී' (පි.52) සඳහන් කරන පරිදි එය 'කාලික ප්‍රතිභාව' නම් විය හැක. අපූර්ව වස්තු නිර්මාණය සඳහා ඉවහල් වන අනෙක් ලක්ෂණය නම් සාමීප්‍යතාවයි. සාමීප්‍යතාව යනු සහෘදයාට කාව්‍යය අවබෝධ කරගැනීමේ පහසුතාවයි. කාව්‍යයේ ප්‍රකාශ හා වාංමාලාව දුරවබෝධ වුවහොත් සෞන්දර්යාත්මක රසාස්වාදය සහෘදයා වෙතින් ගිලිහී යනු ඇත. මේ අනුව භාරතීය සහෘදයාට ඍතුසංහාර කාව්‍යය මුළුමනින් ම සාමීප්‍යතා ලක්ෂණයෙන් යුක්ත බවට බොහෝ නිදර්ශනයෝ වෙති. අනෙක් ලක්ෂණය නම් අනුරූපතාවයි. එනම් කාන්තාවක විසින් ආභරණ පළඳන ලෙසින් කාව්‍යයේ යෝග්‍යතාව හෙවත් 'ගැළපීම' ආරක්ෂා කරගැනීමයි. දුරවබෝධ සංකල්පවලින් තොර ඍතුසංහාර කාව්‍යය අනුරූපතා වැනි

උදහරණවලින් සම්පූර්ණ වේ. එහෙත් ඇතැම් සංස්කරණයන්හි පවත්නා පද්‍ය ගැළපීමේ අක්‍රමවත් බව අර්ථය හා රසය ගලා යාමට බාධා පමුණුවා ඇත. (උදා. පළමු සර්ගයේ සත්වැනි ශ්ලෝකයෙන් පසුව යෙදෙන ශ්ලෝක කාන්තා වර්ණනා වේ. නැවතත් ග්‍රීෂ්ම ඍතුවේ ස්වභාවය වර්ණනා කරනුයේ 10 වැනි ශ්ලෝකයේ සිටයි. මේවා අනුරූපතා ලක්ෂණයට හානියකි.) අපූර්ව වස්තුවේ භාවයන්හි සාරවත්භාවය ආරක්ෂා කිරීමට නම් ඉතා පැහැදිලි හා අර්ථ පූර්ණ වාක්‍ය රටාවක් කවියා විසින් භාවිත කළ යුතු වේ. ඍතුසංහාර කාව්‍යයෙහි ජනප්‍රිය හා ප්‍රායෝගික වාඞ්මාලාවක් යොදා ගෙන ඇති බව පෙනේ. මෙසේ ගත් විට ඍතුසංහාර කාව්‍යය සාමාන්‍ය සහෘද මනසට වඩාත් යෝග්‍ය කෘතියක් බව පෙනේ.

ඉහත දැක් වූ ලක්ෂණ කැටි කරගත් කාලිදාස කවියා අවස්ථා හා සංකල්ප නිරූපණය සඳහා දරා ඇති උත්සාහය ඍතුසංහාර කාව්‍යයේ පහත නිදර්ශනවලින් පැහැදිලි කර ගත හැක.

- **අනංග දේව නිර්මාණය**

  **6.1-** අනංගයා රති ක්‍රීඩාශක්ත කාමීන්ගේ සිත් දදුරු කරන්නට පැමිණ ඇත. ඔහු අඹ දළු තියුණු හී ලෙසත් මී මැසි වැල දුනු දිය ලෙසත් රැගෙන යුදයට පැමිණි වීරයෙකි.

  **6.28** වසන්ත සමය අනංග දෙවියාය. ඔහු අඹ රේණු හීසර ලෙසත් කැල මල් දුන්න ලෙසත් රාත්‍රියේ චන්ද්‍රයා මුතු කුඩය ලෙසත් මලය මාරුතය ඇතුන් ලෙසත් කොවුලන් ගායකයන් ලෙසත් රැගෙන ලෝකයට යහපත ප්‍රදනය කිරීමට පැමිණ ඇත.

- **නව යෞවනියක හා කාන්තාවක ලෙස නිර්මාණය**

  **3.1-** මුළු පරිසරය ම වැලුක් මල් පිපී සුදු වස්ත්‍රයක් එළුවා වැනිය. පියුම් පිපී සුන්දර උවනක අසිරිය ගෙන ඇත. පා සළඹෙහි නාදය හංසයන්ගේ නාදය හා සමාන වේ. පැසුණු සුවඳැල් ධාන්‍ය සුන්දර ශරීර අඟ පසඟ මෙන් දිස්වේ. එවැනි ලක්ෂණ යුක්ත නව යෞවනියක ලෙස සරත් කාලය පැමිණ ඇත.

  **3.7.** සරත් සමයේ රාත්‍රි කාලය කුඩා දැරියක් යෞවනියක බවට පත් වන්නා සේ දිනපතා මහත් බවට පත් වේ. රාත්‍රි සමය තරු නම් අබරණින් සැරසී ඇත. වැසි වළාවන්ගෙන් මිදුණු සඳ නිකැලැල් මුහුණක සුන්දරත්වය ගනී. රාත්‍රි නම් දැරිය සඳ රැස් නම් වස්ත්‍රයෙන් සැරසී ඇත.

  **4.10** - හේමන්ත සමයේ පියඟු වැල පෙම්වතා නොමැති තරුණියක මෙන් පඬුවන් බවට පත් වේ. මේ පියඟු වැල ශීත සමයේ ශීතලෙන් ගැහෙමින් අතෝරක් නැතිව ඔබිනොබ සැලේ.

  **2.7** - වර්ෂා සමයේ ගංගාවෝ කාමුක ස්ත්‍රීන් මෙනි. ගංගාවන්හි බොර ජලය විසින් ගං ඉවුරේ ගස් උදුරා දමමින් කාමුක කාන්තාවන් දඟකාර ලෙස ඉදිරියට ඇදී යන්නාක් මෙන් ගංගාවෝ නොනැවතී ඉදිරියට ම ඇදීයති.

  **3.3** - සරත් ඍතු සමයේ ගංගාවෝ තරුණ මද සහිත කාන්තාවන් මෙන් ගලායති. කාන්තාවෝ මේඛලාදමයෙන් සැරසී සිටිති. ඒවා ගංගාවන්හි පෙති මාළුවෝ වෙති. ගං ඉවුරු මත වසා සිටින කුරුළු රැන කාන්තාවකගේ මුතු මාලය වේ. විශාල වැලි තලා ඇගේ උකුළු ප්‍රදේශයයි.

  **3.23** - සරත් කාලයේ රුවැති තරුණියකගේ මුහුණ මෙන් උදෑසන නෙළුම් මල් විකසිත වේ. එසේ ම උදෑසන සඳ අවරට ගිය විට කුමුදු මල් වැසී යන්නේ දුරු රට සිටින කාන්තාවකගේ සිනහව මෙනි.

- **රජෙකු ලෙස නිර්මාණය**

  **3.4.** වැසි ඇද වැටීමෙන් මුළු අහස් තලය ම ජලය නැති සංඛයක් හා නෙළුම් දඬුවක් මෙන් සුදු බවට පත් වී ඇත. එනම් අහසේ වළාකුළු සැහැල්ලු වී සුළං වේගයෙන් ඈතට ගමන් කරනු ඇත. වළාකුළු සෙමෙර වල් විදුනා සමූහයකට උපමා කොට ඇත. එයින් පවත් සළනු ලැබූ රජෙකු ලෙස වර්ෂා ඍතුව දක්නා ලැබේ.

- **ශරීර අවයව නිර්මාණය**

  ඇස්බැම - **3.17** සරත් ඍතුවේ ගංගාවන්හි සියුම් හා තුනී රැළිවලින් කාන්තාවන්ගේ ඇසි බැම සැළීම් දිනා ඇත.

  තොල්පෙති- **3.25** සරත් සමයේ වද මලක රතුවන් පාට කාන්තාවකගේ තොල් පෙතිවල ස්වභාවය ගෙන ඇත.





02 OCT 2015

පියයුරු - 2.2 වර්ෂා සමයේ වැසි වළාකුළු ගැබ් ගත් කාන්තාවකගේ පියයුරු මඬලේ කලුවන් පැහැය ගෙන ඇත.

- **සත්ව හා පක්ෂි නිර්මාණය**

ගිරා තුඩ - 6.20 වසන්ත සමයේ සුන්දර ප්‍රේමවන්තින්ගේ මුහුණු ගිරා තුඩු මෙන් රන්වන් පාට වී ඇත. ඒවා දකින තරුණයන්ගේ සිතට දුකක් උපදී.

හංස නාදය - 1.5, 3.24 හා 4.4 කාන්තාවෝ නූපුර පයෙහි ලා හංස නාදය මතු කරමින් ගමන් කරති.

3.24. සරත් ඍතුවේ දුරු රට වෙසෙන විරහී පුද්ගලයෝ හංස නාදය අසා මෙබලාදමයන් පළඳින ප්‍රියාවියන් සිහිපත් කරති.

ඇතුන් - 2.15 වර්ෂා සමයේ කලුවන් වළාකුළු සමූහය තවත් ඇතුන් පංතියක් වෙති'යි සැබෑ ඇත්තු රවටති.

- **ආභරණ නිර්මාණය**

වෛරෝඩි මාණික්‍යය - 2.5 වර්ෂා සමයේ තෘණ අංකුර බබළන නිල් මැණික්වල කාන්තිය දරයි.

රිදී සංඛය - 3.4 සරත් කාලයේ වැසි වළාකුළු ජලය රහිත නිසා රිදී සංඛ හා සමාන වේ.

ස්වර්ණ වර්ණය - 1.26 ග්‍රීෂ්ම ඍතුවේ ඉඹුල් ගස්වල ගින්න රන්වන් පාටක් මතු කරයි.

මරකත (පච්ච) මැණික - 3.21 සරත් ඍතුවේ පැහැදිලි ආකාශය මරකත මැණිකක සුන්දරත්වය ඇති ජලාශයක් මෙන් දිස් වේ.

මුතුහර - 4.2 හේමන්තයේදී සඳ වැනි මුතුහරවලින් කාන්තාවෝ පියයුරු අලංකාර නොකරති.

- **පුෂ්ප නිර්මාණය**

වද මල - 3.24 සරත් සමයේ ප්‍රවාසී කාමී ජනයා කාන්තා තොල් පෙති සඟලෙහි කාන්තිය වද මලක දුක වියවුල් සිත් ඇතිව ශෝක වෙයි.

වැලුක් මල් - 3.26 සරත් ඍතුව සුදු වස්ත්‍ර හඳින කාන්තාවක මෙන් වැලුක් මල්වලින් පිරී ඇත.



හෙළුපුල් මල් - 2.2 වර්ෂා සමයේ උපුල් පත්‍ර කාන්තියට සමාන වූ වළාකුළු අහස පුරා පැතිරී ඇත.

2.16 වර්ෂා සමයේ වළාකුළු සුදු උපුල් මලක කාන්තියට සමාන වේ.

3.26 සරත් සමය හෙළුපුල් මල් කාන්තිමත් තරුණියක මෙනි.

කොඳ මල් - 4.2 හේමන්ත සමයේ කුමුදු මල් (කොඳ) විකසිත වී ඇත.

කොකුම් මල් - 1.24 ග්‍රීෂ්ම සමයේ ලැව් ගින්න කොකුම් මලක් බඳු වේ.

නිලුපුල් මල් - 2.9 වර්ෂා ඍතුවේ මුව දෙණුන්ගේ දෙනුවන් නිලුපුල් හා සමාන වේ.

2.12 වර්ෂා ඍතුවේ දුරු රට ගිය ප්‍රියයන් ගැන සිතා කාන්තාවෝ නිලුපුල් වැනි නෙත් කඳුළින් තෙමති.

2.22 වර්ෂා සමයේ වළාකුළු මහනිල් මලක පත්‍රයකට සමාන වේ.

3.17 සරත් සමයේ කාන්තාවන්ගේ දෙනෙත් සරාගී බැල්ම නිසා නිලුපුල් මෙන් පෙනේ.

නෙළුම් මල් - 4.5, 4.13 හේමන්ත කාලයේ කාන්තාවගේ මුහුණ නෙළුමක් මෙනි. සිනිඳුය. වටකුරුය.

5.5 ශිශිර ඍතුවේ කාන්තාවෝ නෙළුමක් වැනි මුහුණ මලු පැණියෙන් සරසති.

- **මානවයාගේ නිර්මාණ-**

නූපුර - 3.25 සරත් ඍතුවේ ආගමනය මාණික්‍යමය නූපුරක කමනීය හඬ මෙන් සුන්දර වේ.

බෙර - 2.4 වර්ෂා සමයේ හෙණ හඬ මර්දල නම් බෙර හඬට සමාන වේ.

අඳුන් - 1.11 ග්‍රීෂ්ම කාලයේ අහස අඳුන් සමාන වේ.

3.5 සරත් ඍතුවේ නිල් අහස බිඳී ගිය අඳුන් සමූහයක් හා සමාන වේ.

කුඩය - 1.18 ග්‍රීෂ්ම කාලයේ නාගයාගේ පෙණය නම් කුඩය යට මැඩියා ගිමන් හරී.

මේ ආදී වශයෙන් කාලිදස විසින් ඍතු සයම සජීවී ලෙස නිර්මාණය කොට ඇත. එහි කෘත්‍රිම ස්වභාවයක් නොමැත. එහෙත් සුපුරුදු කාව්‍යකරණ ආකෘතිය ම අනුගමනය කළ නිසාදෝ සාම්ප්‍රදායික භාවිතයන් හා වාග් ප්‍රයෝගයන් 'බහුල වශයෙන් යොදා තිබෙනු ග්‍රන්ථය අධ්‍යයනයේදී දැකිය හැක. එය ආධුනික කවියෙකුගේ ලක්ෂණයක් විය හැක. එබැවින් ආධුනික අත්දැකීම් හා නිරීක්ෂණයන් බහුල විය. එහෙත් කාලිදසයන්ගේ පසුකාලීන මහාකාව්‍යයන් දෙස බලන විට ඒවායේ නිර්මාණ ශක්තිය වැඩි දියුණු වූ බව අවිවාදිතයි. ඒ අනුව බොහෝ වියතුන් ප්‍රකාශ කරන පරිදි ඍතුසංහාර කාව්‍යය කාලිදසයන්ගේ තරුණ අවධියේදී රචනා කරන්නට ඇතැයි යන්න නිගමනය කිරීමේ සාවද්‍යතාවක් නොපෙනේ. මේ සම්බන්ධයෙන් එම්. ආර්. කාලේ වියතාණන් ඍතුසංහාරයේදී සමාන සංකල්පයන් හා අදහස් බොහෝ දුරට සමාන වචනවලින් ම නැවත නැවතත් දක්වා ඇති බව පෙන්වා දේ. ඔහු දක්වා ඇති පරිදි එකී ශ්ලෝකවලින් නිදර්ශන කීපයක් මෙසේය.

ප්‍රචණ්ඩ සූර්‍යඃ (1.1)
ප්‍රචණ්ඩ සූර්‍යාතපතාපිතා මහී (1.10)
නිතම්බ බිම්බෛඃ සදුකූල මේඛලෛඃ (1.4)
නිතම්බදේශාශ්ච සහේමමේඛලාඃ (1.6)
ස්තනෛඃ සහාරාභරණෛඃ සචන්දනෛඃ (1.4)
පයෝධරාශ්චන්දන පඞ්කචර්චිතාඃ (1.6)
විමුච්‍ය වාසාංසි ගුරූණි සාංප්‍රතම් (1.7)
ගුරූණි වාසාංසි විහාය තූර්ණං (6.13)
ස්තනේෂු තන්වංශුකමුන්නතස්තනා තන්වංශුකෛඃ
කුඞ්කුමරාගගෞරෛ - නිවේශයන්ති ප්‍රමදාඃ සයෞවනාඃ (1.7)
රලංක්‍රියන්තේ ස්තනමණ්ඩලානි (6.4)
ගභස්තිභිර්භානුමතෝ'භිතාපිතා (1.15)
රශ්මයූඛෛරභිතාපිතෝ භෘශං (1.17)
විලෝල ජිහ්වඃ (1.14)
විලෝල ජිහ්වද්වය (1.20)
නිතාන්තනීලෝත්පල පත්‍රකාන්තිභිඃ (2.2)
කුවලයදලනීලෛඃ (2.22)
ස්තනෛඃ සහාරෛඃ (2.18)



දධති වරකුච ග්‍රෛරුන්නතෛර්හාරයෂ්ටිං (2.25)
විකචපද්මමනෝඥවක්ත්‍රා (3.1)
විකච කමල වක්ත්‍රා (3.26)
ප්‍රයාන්ති සංගං වලයාංගදානි (4.3)
භුජේෂු සංගං වලයාංගදානි (6.6)

බොහෝ වියතුන් විසින් කාලිදාස කවියා ආධුනිකයෙකු ලෙස සැලකුව ද ඔහුගේ දක්ෂතාව ඍතුසංහාර කාව්‍යයේ අන්තර්ගත වූ වෘත්තයන් දෙස බැලීමෙන් පැහැදිලි වේ. ඉන්ද්‍රවජ්‍රා, උපේන්ද්‍රවජ්‍රා ආදියෙන් ආරම්භ කළ වෘත්ත භාවිතය වසන්තතිලකා, ශාර්දූල වික්‍රීඩිත ආදි චමත්කාර හා අවස්ථෝචිත වෘත්තයන් ප්‍රයෝග කිරීමට තරම් කාලිදාස සාමර්ථ්‍ය ලබා ඇත. කාව්‍ය පුරාම එවැනි වෘත්තයන් 08 ක් පමණ යොදා ඇත.

කෙසේ වුවද ඍතුසංහාර කාව්‍යය පිළිබඳව විද්වතුන් අතර විවිධ අදහස් ද පවතී. ඒ අනුව බොහෝ විද්වත්හු මේ කාව්‍යයේ කාලිදසගේ කර්තෘත්වය ගැන පවා සැක පහළ කරති. එහෙත් ඇතැමෙකුගේ අදහස වූයේ තත් කෘතියේ කර්තෘ කාලිදස ම බවයි. නිදර්ශනයක් ලෙස වල්ලභදේව විසින් තම සුභාසිතාවලියට කාලිදසගේ ඍතුසංහාරයෙන් පද්‍ය දෙකක් උපුටා ගෙන ඇත. එනම්
'මත්තෝද්විරේඵ පරිචුම්බිත චාරුපුෂ්පා' - (ඍතු- 6.17)
'කිං කිශුකෛඃ ශුකමුඛච්ඡවිභිර් න භින්නං' - (ඍතු- 6.29)
එසේම වත්සභට්ටි විසින් ක්‍රි.ව. 473-74 දී පමණ රචිත මන්දසෝර් ශිලා ලේඛනය සඳහා ශීත හා වසන්ත ඍතූන් වර්ණනා කිරීමට ඍතුසංහාරයෙන් ආභාසය ලබා ඇති බව පෙන්වා දිය හැක. මේ අනුව ඍතුසංහාරය ක්‍රි.ව. පස්වැනි සියවසේ ආරම්භයට පසුව රචනා වූවක් නොවිය හැකි බවට විශ්වාස කළ හැක. අනෙක් අතට කාලිදස ඍතූන් වර්ණනා කිරීමේ මහත් අභිරුචියක් දක්වා ඇත. කුමාරසම්භව මහා කාව්‍යයේ වසන්ත ඍතුව, වික්‍රමෝර්වශී නාට්‍යයේ හා මේඝදූතයේ වර්ෂා ඍතුව, අභිඥාන ශාකුන්තල නාට්‍යයේ ග්‍රීෂ්ම ඍතුව හා රඝුවංශයේ සියලු ඍතූන් වර්ණනා කිරීමට කාලිදසයන් දක්ෂ වී ඇත. ඒ වනාහි ඍතූන් වර්ණනා කිරීමේ ඔහුගේ කුශලතාව හා ධී ශක්තියයි.

මේ අනුව ඍතුසංහාර කාව්‍යය සෙසු කවීන්ගේ අවධානය යොමු වූ කාව්‍යයක් බව සඳහන් කළ හැක. එසේම කාලිදාස කවියාගේ සෙසු කෘතීන් හා සන්සන්දනය කොට බැලීමේදී ඍතුසංහාර කාව්‍යය

මුහුකුරා යන කවිත්වයේ ලක්ෂණ දැකිය හැකි බව ද සඳහන් කළ යුතු වේ.


ආශ්‍රිත ග්‍රන්ථ.

1. දාහාල, ආචාර්ය ලෝකමණි. (1998). ධ්වන්‍යාලෝක. භාරතීය විද්‍යා ප්‍රකාශන, දිල්ලි.
2. පේමරතන ස්ථවිර, වැලිවිටියේ, හා හල්ගස්තොට දේවනන්ද ස්ථවිර. (2000). සුබෝධිනී ව්‍යාඛ්‍යා සහිත කාව්‍යදර්ශ. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
3. සේනානායක, ජී.බී. (1965). විචාර ප්‍රවේශය. ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ.
4. සේනානායක, ජී.එස්.බී. (1969). ධ්වන්‍යාලෝක විවරණය. ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ.
5. Aggarwal, Vinod. (1985). The Imagery of Kalidasa. Eastern Book Linkers, India.
6. Kale,M.R. (1997). The Rtusamhara of Kalidasa. Motilal Banarsidas, New Delhi
7. Laxmi Prapannacharya, Sri Pt.Laxmi. (1977). Rtusamharam (Hindi). Chawkhamba,Varanasi.

- මෙම ලිපිය සැකසීමේදී මේ ලේඛකයා විසින් සම්පාදනය කරන ලද 'ඍතුසංහාරම්' (2012) කෘතිය විශේෂයෙන් ආශ්‍රය කරන ලදී. එම ග්‍රන්ථය 2013 වර්ෂයේ රාජ්‍ය සාහිත්‍ය සම්මානය සඳහා අවසාන වටයට තේරී පත්විය. ප්‍රකාශනය- කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.